
# 02 සිදුහත් කුමරුගේ ළමා කාලය හා යොවුන් විය

මෙවර  වෙසක් සඟරාවේ හය වන ශ්‍රේණියේ දරුවන්ට නියමිත ව ඇත්තේ සිදුහත් කුමරු ළමා වියේ සිට තම සහජ දක්ෂතා මතු කර ගනිමින් ජීවිතය සාර්ථක කර ගත් අන්දම ඉස්මතු වන ආකාරයට ලිපියක් සකස් කිරීම ය. **සිදුහත් කුමරුගේ ළමා කාලය හා ශිල්ප දැක්වීම** පිළිබඳ ව එම දරුවන් සඟරාවට ඇතුළත් කළ  ලිපිය කියවා බලමු.

බෝසත් කුමරුගේ උපත පිළිබඳ පුවත මුළු කිඹුල්වත් පුරයේ ම පැතිර ගියේ ය. ඒ ගැන රට වැසියෝ ඉමහත් සතුටට පත් වූහ. සුද්ධෝදන රජතුමාගේ



ගුරුවරයා වූ **අසිත** හෙවත් **කාලදේවල** තවුසා මේ පුවත දැන ගත් කල්හි කුමරු දැකීමට මාලිගයට පැමිණියේ ය. රජතුමා පුත් කුමරු රැගෙන ගුරුවරයා වන්දවා ආශීර්වාද ගැනීමට ආ විට එම කුමරාගේ සිඟිති දෙපා අසිත තවුසාගේ ජටාව මත පිහිටියේ ය. එවිට තවුසාණෝ පළමු ව සිනා සී දෙවනු ව ඇඬූහ. එසේ කළේ මන්ද යි රජතුමා ඇසූ විට තාපස තුමෝ මෙසේ පැවසූහ.


''රජතුමනි, මේ කුමරු ඒකාන්තයෙන් ම බුදු වෙනවා. එබැවින් මම සිනාසුණෙමි. කුමරු බුදු වන්නට පෙර මා මිය යන බැවින් හැඬුවෙමි.''

පසු ව අසිත තවුසා පුංචි කුමරුට දෙහොත් මුදුන් දී වැන්දේ ය. එය දුටු සුදොවුන් රජතුමා ද පුත් කුමරුට වැන්දේ ය. මෙය තම පුතුට පිය රජතුමාගේ පළමු වැඳුම ය.

එකල දඹදිව පැවති සිරිත අනුව දරුවකු බිහි වී පස් වන දිනයෙහි නම් තැබීමේ උළෙල පැවැත්වෙයි. බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට පඬිවරු 108ක් කැඳවන ලදහ. ඒ අතරින් තෝරා ගත් ඉතා උගත් පඬිවරුන් අට දෙනාට එම කාර්යය පවරන ලදි. ඉන් සත් දෙනෙක් ම කුමරා ගිහිගෙයි විසුවොත් සක්විති රජකම ලබන බවත් පැවිදි වුව හොත් බුද්ධත්වයට පත් වන බවත් කීහ. එහෙත් වයසින් බාල කොණ්ඩඤ්ඤ නම් බමුණා එක ඇඟිල්ලක් ඔසවා, 'ශරීර ලක්ෂණ අනුව කුමරා ඒකාන්තයෙන් ම බුදු වන බව' පැවසී ය. ලොවට යහපතක් හෙවත් අර්ථයක් සිද්ධ කර දෙන බැවින් **සිද්ධාර්ථ** යැයි නම තැබිය යුතු බව සියලු පඬිවරු තීරණය කළහ.

සිදුහත් උපත සිදු වී සත් දිනකින් මහාමායා දේවිය කලුරිය කළා ය. පුංචි කුමරා හද වඩා ගැනීම මහාමායා දේවියගේ නැඟණිය වූ **මහා ප්‍රජාපතී ගෝතමී දේවියට** භාර විය. ඇය සිදුහත් කුමරු තමාගේ ම දරුවකු සේ හොඳින් රැක බලා ගත්තා ය.

ශාක්‍ය ජනපදයේ කුඹුරු ගොවිතැන් කරන කාලයේ සී සෑමේ උත්සවයකට එනම් වප් මඟුල් උළෙලකට- රජතුමා සිදුහත් කුමරුන් ද රැගෙන ගියේ ය. කුමරු කිරි මවුවරුන් භාරයට පත් කර රැකවල් යොදා රජතුමා කුඹුරට බැස සී සෑමට එක් විය. ටික වේලාවකින් කිරි මවුවරුන් ද උත්සවය නැරඹීමට මඳක් ඔබ්බට ගිය බව දුටු කුමරා, **ආනාපාන සති** භාවනාව වඩමින් පලක් බැඳ සිටියේ ය. මේ බව දුටු කිරිමවුවරු වහා ඒ බව රජතුමාට දැනුම් දුන්හ. ඉන්



මහත් පුදුමයටත් සතුටටත් පත් රජතුමා පුත් කුමරුගේ භාග්‍යවන්තකම ගැන සිතා කුමරුට නමස්කාර කළේ ය. මෙය පිය රජුගේ දෙවන වැඳුමයි. මෙම අසිරිමත් සිදුවීම වන විට කුමරුට වයස මාස පහකි. කාලය ගෙවී ගියේ ය. කුමරු කෙළිදෙලෙන් මාලිගාවෙහි වැඩුණි.

සිප් සතර හැදෑරීමට සුදුසු කල පැමිණි විට සුද්ධෝදන රජතුමා **සර්වමිත්‍ර** නම් වූ බමුණු පඬිවරයා ගෙන්වා ඔහු ලවා සිදුහත් කුමරුන්ට සූසැට කලා ශිල්ප හා සියලු ශාස්ත්‍ර ඉගැන්වී ය. කුමරු එහි දී කෙටි කලකින් ම සියලු සිප්සතර හදරා නිම කළේ ය. නමුත් සිදුහත් කුමරු තමා උගත් ශිල්ප කිසි විටෙකත් අන් අය හිංසාවට පීඩාවට පත් කිරීම සඳහා යොදා ගත්තේ නැත. එහි දී කුමරු සමග ශිල්ප ශාස්ත්‍ර උගත් නන්ද හා කාළුදායි යන කුමාරවරුන් සමග ද ඉතා සමගියෙන් කටයුතු කළේ ය. එසේ ම ගුරුතුමාට ඉතා කීකරු ව හොඳින් උගත්තේ ය. ගුරුතුමා යමක් ඉගැන්වූ විට ඒ ඔස්සේ තව බොහෝ දේ සොයා බලා තම දැනුම දියුණු කර ගත්තේ ය.

කුමරුට වයස අවුරුදු දහසයක් විය. එකල චාරිත්‍රය අනුව සුද්ධෝදන රජතුමා තම පුත් කුමරුට සුදුසු කුමරියක සරණ පාවා දීම සඳහා තම ඥාතීන්ට පණිවුඩ යැවී ය. එවිට ''සිදුහත් කුමරු ශිල්ප කිසිවක් නොදත්තෙකැ'යි'' ඥාතීන් අතර

ඇති වූ රාවය කුමරුට දැනගන්නට ලැබිණ. කුමරු එම අභියෝගයට නොසැලී මුහුණ දුන්නේය. දින හතක් ඇතුළත තමා ශිල්ප දක්වන හෙයින් කිඹුල්වත් නුවර ශිල්ප දක්වන භූමියට සියලු දෙනාට ම පැමිණෙන ලෙස අණබෙර ගැස්වීය. එහි දී සිදුහත් කුමරු සිය නෑදෑයින් ඉදිරියේ ඔවුන් විස්මයට පත් කරවමින් කඩු ශිල්ප, දුනු ශිල්ප ආදී ශිල්ප දෙළහක් ප්‍රදර්ශනය කළේ ය. එහි දී සුප්‍රබුද්ධ රජුගේ දියණිය වූ **යසෝදරාව** කුමරු සමග විවාහ වීමට ඉදිරිපත් වූවා ය.




ළමා වියේ සිට ම සහජ දක්ෂතා පෙන්වමින් ශිල්ප ශාස්ත්‍ර මනා ලෙස හැදෑරීමෙන් සිදුහත් කුමරුට අභියෝග ජය ගැනීමට හැකි විය. අපගේ ජීවිතවලට ද එම ආදර්ශය එක් කර ගැනීමට උත්සාහ ගනිමු.

## සාරාංශය

- ★ පිය රජතුමා තම පුතුට පළමු ව වැන්දේ අසිත තාපසතුමා කුමරුට වැන්ද අවස්ථාවේ දී ය.
- ★ බෝසත් කුමරුට නම් තැබීම සිදු කළේ ඉපදී දින පහකට පසු ව ය. ඒ සඳහා මාලිගයට බමුණෝ 108ක් කැඳවනු ලැබූහ.
- ★ ලොවට අර්ථය සිද්ධ කර දෙන බැවින් බෝසත් කුමරු සිද්ධාර්ථ ලෙසින් නම් කෙරිණි.
- ★ කුමරු ඉපදී දින 7න් මහාමායා දේවිය කලුරිය කළෙන් මහා ප්‍රජාපතී ගෝතමී සුළුමවු වූවා ය.
- ★ වප් මඟුල් උත්සවයේ දී කුමරු පලක් බැඳ අනාපානසති භාවනාව කළ අතර එදින පිය රජුගේ දෙවන වැඳුම සිදු විය.
- ★ සිදුහත් කුමරු ශිල්ප උගත්තේ සර්වමිත්‍ර බමුණාගෙනි.
- ★ ශිල්ප හැදෑරීමේ දී දක්ෂ ලෙස කටයුතු කිරීම සිදුහත් කුමාර චරිතයෙන් අපට ගත හැකි ආදර්ශයකි.
- ★ තම දක්ෂතා දැක්වීමට අවස්ථාවක් පැමිණි විට උගත් ශිල්ප මැනැවින් දක්වා අභියෝග ජය ගැනීමට සිදුහත් කුමරු සමත් විය.
- ★ දෙව්දහ නුවර සුප්‍රබුද්ධ රජතුමාගේ දියණිය වන යසෝදරා දේවිය සිදුහත් කුමරු සමග විවාහ වීමට ඉදිරිපත් වූවාය.
- ★ නන්ද හා කාළුදායි යනු සිදුහත් කුමරු සමග එකට හැදුණු කුමරුන් දෙදෙනෙකි.

## ක්‍රියාකාරකම



(1) පහත සඳහන් වගන්ති හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යොදන්න.

i. අසිත තවුසා සිනා සුණේ සිදුහත් කුමරු ඒකාන්තයෙන් ම බුදු වන බව දැන ගත් නිසා ය. (  )
ii. නම් තැබීමේ උළෙලට පඬිවරු 102ක් සහභාගි වූහ. (  )
iii. පිය රජුගේ දෙවන වැඳුම වප් මඟුල් ද සිදු විය. (  )
iv. කුමරා ඉපදී සත් දිනකින් මහාමායා දේවිය කලුරිය කළා ය. (  )
v. සිදුහත් කුමරුගේ ගුරුවරයා සර්වමිත්‍ර බමුණා ය. (  )

(2) නිවැරදි පිළිතුරු යටින් ඉරක් අඳින්න.

i. සුද්ධෝදන රජුගේ ගුරුවරයා (සර්වමිත්‍ර/ අසිත) බමුණා ය.
ii. සිදුහත් කුමරු ආවාහ වූයේ (යසෝදරා/ විශාඛා) කුමරිය සමග ය.
iii. නම් තැබීමේ උළෙල පැවැත්වූයේ කුමරු ඉපදී (පස් වන / දෙවන) දිනයේ දී ය.
iv. එක ඇඟිල්ලක් ඔසවා කුමරු බුදු වන බව ප්‍රකාශ කළේ (කොණ්ඩඤ්ඤ/ වප්ප) බමුණා ය.
v. යසෝදරා දේවිය (සුප්‍රබුද්ධ / සුද්ධෝදන) රජුගේ දියණිය යි.

## පැවරුම



i. සිදුහත් කුමාර චරිතයේ උපතේ සිට ශිල්ප දැක්වීම තෙක් වැදගත් සිදුවීම් පෙළ ගස්වා රූප රාමු සහිත ව ඉදිරිපත් කරන්න.

ii. සිදුහත් කුමාර චරිතයේ පාඩමට නියමිත කොටසින් ශිෂ්‍යයෙකුට ගත හැකි ආදර්ශ නම් කර පාසල් බිත්ති පුවත් පතෙහි පළ කරන්න.